		කාර්යාල නිලධාරීන්ගේ ධනාත්මක ආකල්පසංවර්ධනය සඳහා මග පෙන්වීම	21	17,100.00	15,300.00	
		එකතුව		98,120.00	90,545.00	92%
5	පැල්මඩුල්ල	කාර්යාල කාර්ය පටිපාටිය සහ කාර්යාල ක්‍රම	76/40	30,500.00	24,815.00	
		එකතුව		30,500.00	24,815.00	81%
6	නිවිතිගල	ලිපිගොනුකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන		14,180.00		
		ලිපිගොනුකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන		14,180.00		
		එකතුව		28,360.00	-	0%
7	ඇලපාත	තක්සේරු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	54	16,930.00	14,380.00	
		කාර්යාල කටයුතු වලදී අවශ්‍ය වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුහුණුව	45	14,550.00	12,300.00	
		පරිගණක ඡායාගත කිරීම්, චිත්‍රාඝයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම		14,550.00	11,700.00	
		එකතුව		46,030.00	38,380.00	83%
8	අයගම	රාජ්‍ය නිලධාරයෙකු සම්බන්ධ සාමාන්‍ය හැසිරීම් හා චිනය	106	23,535.00	23,535.00	
		අල්ලස් හෝ දූෂණය වැළැක්වීම්	82	23,015.00	20,015.00	
		ලිඛිත සන්නිවේදනය	87	26,075.00	21,045.00	
		එකතුව		72,625.00	43,550.00	60%
9	කුරුවිට	රාජකාරී ලිපි සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන	40	16,700.00	15,200.00	
		අධිකරණ කටයුතු සහ සම්ථකරණය	40	16,500.00	15,900.00	
		චිනය කටයුතු සම්බන්ධ මූලික විමර්ශනය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	40	16,500.00	15,000.00	
		එකතුව		49,700.00	46,100.00	93%
10	කිරිඇල්ල	කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන	100	14,450.00	14,450.00	
		කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන		14,450.00		
		රාජ්‍ය සේවකයාගේ සුභවාදී ආකල්ප සංවර්ධනය	100	15,350.00	15,350.00	
		රාජ්‍ය සේවකයාගේ සුභවාදී ආකල්ප සංවර්ධනය		15,350.00		
		එකතුව		59,600.00	29,800.00	50%
11	රත්නපුර	ඉදිකිරීම් නාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන	10	4,230.00	4,230.00	
		බෝනොවන රෝග නිවාරණය	50	6,900.00	6,900.00	
		ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව	50	13,100.00	13,060.00	
		රාජ්‍ය නිලධාරීන්ගේ චිනය පිළිබඳ පුහුණුව	41	4,400.00	3,840.00	
		නායකත්වය හා නව්‍යකරණය පිළිබඳ පුහුණුව	64	7,400.00	8,275.00	
		රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය	60	6,100.00	6,705.00	

		ප්‍රථමාධාර වැඩසටහන	50	6,400.00	5,500.00	
		ආතති කළමනාකරණය සහ රසවින්දන වැඩසටහන	75	3,400.00	3,400.00	
එකතුව				**51,930.00**	**51,910.00**	**100%**
12	**ඉඹුල්පෙ**	අධිකරණ කටයුතු හා සාම නිලධාරියෙකුගේ කාර්යභාරය	24	7,170.00	5,669.60	
		කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	70	9,250.00	8,050.00	
		ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	130	15,120.00	13,358.00	
		ධනාත්මක චින්තනය හා ස්වයං අභිප්‍රේරණය	130	19,250.00	12,389.40	
		ලිපිගොනු ක්‍රමවත්ව සකස් කිරීමේ පුහුණු වැඩසටහන	24	6,730.00	5,000.00	
එකතුව				**57,520.00**	**39,467.00**	**69%**
13	**ඇහැලියගොඩ**	උසාවි කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන	45	17,720.00	14,720.00	
		ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණුව	60	20,220.00	17,220.00	
එකතුව				**37,940.00**	**31,940.00**	**84%**
14	**ඕපනායක**	රාජ්‍ය සේවකයාගේ සුබවාදී ආකල්ප වර්ධනය	80	15,800.00	14,050.00	
		ආතති කළමනාකරණය (STRESS MANAGEMENT)	80	15,800.00	14,050.00	
		කාර්යාල කළමනාකරණය	50	10,850.00	9,400.00	
		ආයතන සංග්‍රහය / කාර්යය පටිපාටික රීති	41	14,150.00	12,350.00	
		රාජ්‍ය නිලධාරී විනය	48	14,750.00	12,350.00	
එකතුව				**71,350.00**	**37,500.00**	**53%**
15	**බලංගොඩ**	ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති සංග්‍රහය, රාජ්‍ය සේවයට අදාළ නෛතික රාමුව	40/ 40	15,250.00	13,935.00	
		ආකල්ප සංවර්ධනය	35/120	29,050.00	28,005.00	
එකතුව				**44,300.00**	**41,940.00**	**95%**
16	**කලවාන**	කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය	74	38,680.00	12,540.00	
එකතුව				**38,680.00**	**12,540.00**	**32%**
17	**කොලොන්න**	ඵලදායිතා ශිල්පක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන (1 කණ්ඩායම)	53	16,200.00	36,486.40	
		ඵලදායිතා ශිල්පක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන (11කණ්ඩායම)	46	15,160.00		
		ඵලදායිතා ශිල්පක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන (111 කණ්ඩායම)	50	15,550.00		
මුළු එකතුව			**2948**	**2,000,000.00**	**927,444.90**	**46%**

07 - පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ අවශ්‍යතාව	අනුකූල වීමේ ප්‍රකාශය (අනුකූල වේ/ නොවේ)	අනුකූල නොවීම පිළිබඳ කෙටි කරුණු දැක්වීමක්	අනාගතයේදී කාර්ය ඉටු නොකිරීම වැලැක්වීමට යෝජනා කරන නිවැරදි කිරීමේ කටයුතු
1	**පහත මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනයේදී ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකිරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකිරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත් සහ ලේඛන පවත්වාගෙන යාම**			
2.1	රා.ප.ව. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරමින් පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල වැටුප් ලේඛනය/පුද්ගල වැටුප් පත් යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කර නියමිත දිනට	අනුකූල වේ		

	භාණ්ඩාගාරයට යවා තිබේ			
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	බඩු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යය අභිනියෝජනය (මූ රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල අභිනියෝජනය කර ඇත.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල අභිනියෝජනය ආයතනය තුල සන්නිවේදනය වී තිබේ.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතරින් සිදු වන ආකාරයට බලතල අභිනියෝජනය කර ඇත.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ වැටුප් මෘදුකාංගය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරුන් විසින් පාලනයන් අනුගමනය කර ඇත.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ		
4.3	වාරෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) යවා ඇත	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය කලට වේලාවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යවා ඇත	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති විසින් නියම කර ඇති කාලය තුල යවා ඇත.	අනුකූල නොවේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූ.රෙ. 134(2), DMA/1-2019 ප්‍රකාරව විගණකාධිපති විමසා වර්ෂය ආරම්භයේදීම අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඇත.	අනුකූල වේ		
6.2	සියලු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුලත පිළිතුරු සපයා තිබේ.	අනුකූල නොවේ		
6.3	සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
6.4	මූ.රෙ. 134 (3) අනුව සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
7	**විගණන සහ කළමනාකරණ කමිටුව**			
7.1	කළමනාකරණ විගණන දෙපා. චක්‍රලේඛ 1-2019 ප්‍රකාර වර්ෂයක් තුල අවම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් මිලදී ගැනීම සහ විනාශ කිරීම පිළිබඳ තොරතුරු වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ඡේද අංක 07 ප්‍රකාරව පාලක ජනරාල් නිලධාරියාට ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
8.2	චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීමට සම්බන්ධීකරණ නිලධාරියෙක් පත්කර, එම නිලධාරියාගේ විස්තර එම චක්‍රලේඛයේ 13 ඡේදයේ දැන්වෙන පරිදි පාලනාධිකාරී කාර්යාලයට යැවීම	අනුකූල වේ		
8.3	භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා අදාළ වාර්තා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ප්‍රකාරව නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.	අනුකූල වේ		
8.4	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරනය වූ අනිරික්ත සහ හිඟය සහ ඒ හා සම්බන්ධ නිර්දේශ, ක්‍රියාමාර්ග චක්‍රලේඛයේ දැක්වෙන නියමිත කාලය තුල සිදු කරන ලදී.	අනුකූල වේ		
8.5	මූ.රෙ. 772 ප්‍රකාරවනුසුදුසු භාණ්ඩවිනාශ කර ඇත	අනුකූල වේ		
9	**රථවාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
9.2	භාවිතයට නුසුදුසු වාහන නුසුදුසුබවට තීරණය කර මාස 6කට නොඅඩු කාලයක් ඇතුලත විනාශ කර ඇත.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් ඇත.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103,104,109 සහ 110 ප්‍රකාරව පියවර ගෙන ඇත.	අනුකූල වේ		
9.5	වාහනවල ඉන්ධන පරිභෝජනය 2016.12.29 දිනැති රා.ප.ව. 30/2016 3.1 ඡේදය අනුව නැවත පරීක්ෂණය කර ඇත.	අනුකූල වේ		
9.6	ලීසිං වාහනවල ලීසිං කාලය අවසන් වූ පසුව පරම අයිතියට වාහන ලොග් පොත මාරු කර ඇත	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කර සහතික කරවාගෙන නියමිත දිනදී විගණනය සඳහා සූදානම් කර ඇත.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂය තුල හෝ පෙර වර්ෂයේ සිට පැවත ආ අක්‍රිය ගිණුම් නිරවුල් කර ඇත.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනයෙන් අනාවරණය වූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති අතර ඒවාට ගැලපීම් කර මාසයක් ඇතුලත් එම ශේෂ නිරවුල් කර	අනුකූල වේ		

	ඇත.			
11	**ප්‍රතිපාදනඋපයෝගී කර ගැනීම**			
11.1	සීමා නොඉක්මවමින් වෙන් කර දුන් ප්‍රතිපාදන වැය කර ඇත	අනුකූල වේ		
11.2	බැරකම් මු.රෙ. 94(1) අනුව වර්ෂය අවසානයේ ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා නැත	අනුකූල වේ		
12	**රාජ්‍ය නිලධාරීන්සඳහා අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවලට අනුකූල වේ	අනුකූල වේ		
12.2	අය වීමට ඇති ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර ඇත.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල අය විය යුතු ණය ශේෂ නිරවුල් කර ඇත.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	ඉකුත් තැන්පත් ඉවත් කිරීම සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාර කටයුතු කර ඇත.	අනුකූල වේ		
13.2	පොදු තැන්පත් පාලන ගිණුම යාවත්කාලීනව පවත්වාගෙන ගොස් තිබේ.	අනුකූල වේ		
14	**අක්මුදල් ගිණුම**			
14.1	මුදල් පොතේ සමාලෝචිත වර්ෂාවසාන ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇත	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය උප අක්මුදල් කාර්යය සම්පූර්ණ කර මාසයක් ඇතුලත නිරවුල් කර ඇත	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවමින් තත්කාර්ය උප අක්මුදල් නිකුත් කර ඇත.	අනුකූල වේ		
14.4	අක්මුදල් ගිණුමේ ශේෂය මාසිකව භාණ්ඩාගාර පොත් සමග සසඳා ඇත	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	ආදායමින් මුදල් ආපසු ගැනීම රෙගුලාසි ප්‍රකාරව සිදු කර තිබේ.	අනුකූල වේ		
15.2	රැස් කළ ආදායම් තැන්පත් ගිණුමට බැර නොකර ඍජුවම ආදායම් ගිණුමට බැර කර ඇත.	අනුකූල වේ		
15.3	හිඟ ආදායම් ලැබීම් මු.රෙ. 176 ප්‍රකාරව විගණකාධිපතිට යොමු කර ඇත.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	කාර්ය මන්ඩලයට ගෙවීම් අනුමත කාර්ය මණ්ඩලය තුල සිදු කර ඇත.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට ලිඛිත රාජකාරි ලැයිස්තු ලබා දී ඇත.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා MSD වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
17	**මහජනයාට තොරතුරු ලබා දීම සම්බන්ධ ප්‍රතිපාදන**			
17.1	තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම් පනත සහ නියෝගවලට අනුව තොරතුරු නිලධාරියෙක් පත් කර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ඇත.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු වෙබ් අඩවිය හෝ විකල්ප වැඩ ක්‍රියාමාර්ග හරහා මහජනතාවට ලබා දී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් මහජන අධිකාරියට එරෙහිව මහජනතාවට චෝදනා කිරීමට / චෝදනා කිරීමට පහසුකම් සලසා තිබේද යන්න.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 සහ 10 වගන්ති ප්‍රකාරව අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මත කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2008(1) දරන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සකස් කර ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇත	අනුකූල වේ		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව පුරවැසි ප්‍රඥප්තිය / පුරවැසි සේවාදායකයාගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර ඇත.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම**	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම් 02හි ආකෘතියෙන් මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.	අනුකූල වේ		
19.2	එකී මානව සම්පත් සැලැස්ම තුල කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථා ලබා දී ඇත.	අනුකූල වේ		
19.3	ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය මත පදනම්ව සමස්ථ කාර්ය මණ්ඩලයම සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර ඇත.	අනුකූල වේ		
19.4	ඉහත කී චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර වගකීම පවරා ඇත.	අනුකූල වේ		
20	**විගණන ඡේද සඳහා පිළිතුරු**			
20.1	පෙර වර්ෂ සඳහා වගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේදවල දැක්වූ අඩුපාඩු නිවැරදි කර ඇත.	අනුකූල වේ		

-අවසානය-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. RAT/A/DSR-FA/SUM/02/21/58

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 25 දින

දිස්ත්‍රික් ලේකම් ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
රත්නපුර.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
25 MAY 2022
ලැබුණු දිනය

ඡේදය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන විගණන වාර්තාව

2021 වර්ෂය සඳහා සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාල නිරීක්ෂණ ඇතුලත් සම්පිණ්ඩන විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை. இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. RAT/A/DSR-FA/SUM/02/21/581 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 මැයි 23 දින.

දිස්ත්‍රික් ලේකම් ,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 20 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කිරීමට ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ යෙදහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක යාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නියා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණන්වරයා ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනිවාර්යයෙන් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්මිත මඟහැරීමෙන්, වරදවා දැක්වීම්වලින් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවිවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනු ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙන්න් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන් පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කෘත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් වට්නාකම් තුළ 278 ශීර්ෂයට අයත් නොවන සහ භාවිතා නොකරන රු. 6,150,000ක වසා දමන ලද පාසල් ගොඩනැගිල්ලක් (අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල උඩකන්ද විද්‍යාලය) ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය නොවන වත්කම් වට්නාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අංශය ඇතුළුව උප ඒකක 19ක හේවල මූල්‍ය ප්‍රකාශන අනුව දේපළ පිරියත හා උපකරණ (මූල්‍ය නොවන වත්කම්) වට්නාකම්වල එකතුව රු. 2,084,793,758ක් සහ 278 ශීර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම වට්නාකම රු. 2,119,331,612ක් වීම නියා රු. 34,537,854ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය නොවන වත්කම් විකිණීම මත (ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වෙන්දේසිය) 2021 වර්ෂයේ ලද රු. 294,710ක ආදායමෙන් රු. 98,395ක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගිණුම්ගත කිරීම හේතුවෙන් රු. 196,315ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.6.3 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණෙන් රු. 106,250ක් වටිනා බැරකම් පිළිබඳ විගණනයට තහවුරුවක් නොවීය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ ශීර්ෂ 278 සඳහා සැලසුම අනුව ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු. මිලියන 302,050 ක් අඩුවෙන් අග්‍රිම ලැබී තිබුණි. මේ අනුව වැඩසටහන් 10ක් යටතේ ගිවිසුම්ගත මුදල රු.මි 149.1 ක් වූ ව්‍යාපෘති 103කින් 102ක වැඩ අවසන් වී තිබුණ ද. අක් මුදල් නොමැති වීම නිසා 2021 වර්ෂ තුළ රු. මි 104.5ක වටිනාකම ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු වුවද. පුනරාවර්තන වැය විෂයයන් 06ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට 47ක පරාසයක ඉතිරි වී පැවතුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 03ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. 58,036,085ක ඉතිරියක් දක්නට ලැබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 87ක පරාසයක විය. මේ සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) 2020/2021 මහ කන්නයේ වී මිලදී ගැනීමට පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාදෙනු ලැබූ රු. 3,000,000ක් වී මිලදී ගැනීම සඳහා භාවිතා නොකරම මහා භාණ්ඩාගාරයට පියවා තිබූ අතර, 2021 වර්ෂයේ අතරමැදි කන්නයේ මුං බීජ අස්වැන්න මිලදී ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තු යටතේ ලද රු. 54,600,000ක ප්‍රතිපාදනවලින් රු. 27,701,254ක් පමණක් එනම් සියයට 50.7ක් පමණක් භාවිතා කර තිබුණි. මේ අනුව 2021 වාර්ෂික ඇස්තමේන්තුවෙන් ද ප්‍රතිපාදන වෙන්කර නොගෙනු වර්ෂය තුළ දී විශේෂ කටයුත්තක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ඉටු කිරීමට අපේක්ෂිත වූ මූං බීජ හා වී අස්වනු මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන වී තිබූ මුදල් නිසි කළමනාකරණයෙන් යුතුව අදාළ කාර්යයට යොදා නොගෙන තිබූ බව නිරීක්ෂණය විය.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 2(අ) ඡේදය අනුව පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුල බැඳීම් හඳුනාගත යුතු වුවත්, සීමාව ඉක්මවා එක් වැය විෂයක රු. 695,199ක් වූ බැඳීම් සඳහා එළඹ තිබුණි.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වියින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18ට වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු 74කින් අවශ්‍යතා 80ක් සඳහා ලබාදුන් රු. මිලියන 946.9ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂ අවසානයේදී, මිලියන 479.6ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එසී ඉතිරිවීම් මූළු ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.

2.5 ගණන්දීමේ නිලධාරි වියින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම් සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන නිරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වර්ගීකරණය	මුදල (රු.)	අනුකූල නොවීම
(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
• මුදල් රෙගුලාසි 571		37,968,871	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11කට අදාළව වර්ෂ 02ක් ඉක්ම වූ නැන්පතු 123ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii)	2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය		
	• 3.2 (iv) ඡේදය	1,485,109	කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ව්‍යාපෘති 03ක් යොමුගත චක්‍රලේඛයට පටහැනිව උප කොන්ත්‍රාත් ලබා දී තිබුණු බව අනාවරණය විය.
(iii)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය		
	• 2.8.1(ආ) මාර්ගෝපදේශය	1,340,300	මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ විෂයය පිළිබඳව දැනුම ඇති නිලධාරියෙකු ඇතුලත් විය යුතු වුවද, ඇමිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව තාක්ෂණික උපකරණ, මහන මැෂින් හා වෙනත් යන්ත්‍ර මිලදී ගැනීම සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	• 3.4 වගන්තිය	999,133	ප්‍රසම්පාදන් අස්ථීන්වය විසින් මිල ගණන් කැඳවීම් මඟින් සුදුසු ලංසුකරුවෙකු තෝරා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල05 ක් එකී විධිවිධානවලට පටහැනිව වාහන 10 ක සේවා කටයුතු සඳහා ගෙවා තිබුණි.
(iv)	2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 03 ඡේදය	542,688	තම කොට්ඨාශයේ යම් විශ්‍රාමිකයකු මියගියහොත් දින 07 ක් ඇතුලත විශ්‍රාම වැටුප් අංකය සහිතව ඒ බව වහාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වසම්භාර ග්‍රාම නිලධාරී විසින් දැනුම් දිය යුතු වුවත් ,එසේ නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල03කට අදාලව මිය ගිය විශ්‍රාමිකයින් 15 දෙනෙකු වෙත ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල් අය කර ගත යුතුව තිබුණි.
(v)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය		ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් ආයතනයේ 2021 ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්කය වෙත ලඟා වීමට ආයතනික කාර්ය මණ්ඩලය යොදවා ගන්නා ආකාරය සහ නිපුණතා පරතරය හඳුනාගෙන එම පරතරය අවම කිරීමට ඉවහල් වන ආකාරයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසෙහි 3.1 ඡේදයේ මූදල් රෙගුලාසි 113(6)(ආ) යන උපදෙස් ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් මඟින් ලබා දුන් ණය හෝ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. එසේ වුවද, ස්ථාන මාරු වීම් යන/එන නිලධාරියෙකුට ද, ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් 05 කට ද, සේවය අතහැර ගොස් වසර 01 සිට වසර 03 දක්වා කාල පරාසයක් තුළ ගත වී තිබුණු නිලධාරීන් 02 කටද, මීය ගොස් මාස 05 සිට මාස 16ක් තුළ ගත වී තිබූ නිලධාරීන් 04 කට ද, අවසාන වාරිකය අයකර අවුරුදු 01 සිට අවුරුදු 12 දක්වා කුල් ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන් 05 කටද රු. 2,213,837ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් මුදල් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

2.8 තැන්පතු

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළව කර්මාන්ත 697 කින් ලබාගත් රැඳවුම් මුදල් රු. 40,722,851 ක් දෝෂ වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් විගණන දිනය වූ 2022 පෙබරවාරි 25 දින වන විට මාස 01 සිට මාස 35 ක් ගත වී තිබුණ ද, ඒවා නිදහස් නොකර තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව 2020/2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේ දී ක්‍රියාකාරකම් 26 ක් එහි අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා නොවීමේ ප්‍රතිශතය සියයට 57 සිට සියයට 100 අතර පරාසයක පැවතුණි.

(ආ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 1995 ජූනි 15 දිනැති චක්‍රලේඛ අංක 2008/04 පරිදි 2019 දෙසැම්බර් 31 දිනට රජයේ ඉඩම් සඳහා බලපත්‍ර / දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ඉඩම් කච්චේරි නොපැවැත්වීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන 01 සිට 06ක් තරම් අඩු පරාසයක් ගෙන තිබීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් නියමානුකූල කිරීමට තිබූ ඉඩම් ප්‍රමාණය හඳුනා නොගැනීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04කට අදාළව යනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් නියමානුකූල කිරීම සඳහා හඳුනා නොගැනීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් නිසිදු බලපත්‍රයක් ප්‍රදානය කිරීමට කටයුතු නොකර තිබීමත් හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

3.1.2 ව්‍යාපෘති නිම් නොකර අත්හැර දැමීම්

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක යමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැය රු. 11,221,410ක් වූ ව්‍යාපෘති 31ක් නිම නොකර අත්හැර දමා තිබුණි.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ 04 ක සහ සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16කට අදාළ දිස්ත්‍රික්කයේ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2418ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටක් ඉන් යෝග්‍ය ඉඩම් ලබාදුන් පවුල් සංඛ්‍යාව 1362ක් වූ අතර එහි ප්‍රගතියසියයට 56 ක ප්‍රතිශතයක් විය.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉකුත් වර්ෂ 04 ක සහ සමාලෝචිත වර්ෂයෙහි ගංවතුරින් හා නායයාම්වලින් හානියට පත් මුළු නිවාස ගණන 23127ක් වූ අතර ලබාදිය යුතුව තිබූ මුළු වන්දි මුදල රු . 1,268,091,549ක් වුවද, 2021 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ලබාදිය යුතු මුදල රු. 276,965,651ක් විය. මෙසේ නොගෙවා ඇති වන්දි මුදල් සඳහා බලපා ඇති ප්‍රධාන හේතුව වශයෙන් ප්‍රතිපාදන නොලැබීම බව විගණනයට ලබාදුන් තොරතුරු අනුව අනාවරණය විය.

3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘති ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තාවට අදාළව 2022 පෙබරවාරි 28 වන දින ඉදිරිපත් කරනු ලැබූ කාර්යසාධන හා ගිණුම් වාර්තාව - 2021 කෙටුම්පත (පරිච්ඡේද 07කින් සහ පිටු 32කින් යුතු) සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 1.7 ඡේදය යටතේ විදේශීය අරමුදල් සැපයෙන ව්‍යාපෘති විස්තර යටතේ CRIP ව්‍යාපෘතිය අවසන් බව සඳහන් කර තිබුණ ද, 04 පරිච්ඡේදයේ 19 වගන්තිය යටතේ ව්‍යාපෘති ප්‍රගතිය දක්වා තිබුණු අතර ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක වී තිබුණි.

(ආ) විශේෂ ජයග්‍රහණ යටතේ 2021 වර්ෂයේ රු. මිලියන 238ක විවිධ ආදායම් එකතු කර දී ඇති බව සඳහන් වන අතර මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. මිලියන 233ක් බව නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂය තුළ ලබාදුන් ජාතික හැඳුනුම්පත් හා ග්‍රාම නිලධාරී සහතික හා උපත්/විවාහ/මරණ ලියාපදිංචි කිරීමේ කාර්යසාධනයට කේන්ද්‍රීකෘත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිකුත් කරන ලද ග්‍රාම නිලධාරී වාර්තා 1373ක් ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය (3.5 ඡේදය) යටතේ ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද ආදායම 2006.02.00 ආදායම් ශීර්ෂය යටතේ රු. 134,000ක් ලෙසත් මූදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු. 98,395ක් ලෙසත් සටහන් කර තිබුණු අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව 2021 වර්ෂයේ ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම රු. 294,710ක් ලෙසත් එකිනෙකට වෙනස් අගයන් දක්වා තිබුණි.

(ඉ) කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව වැඩසටහන් 02ක ප්‍රගතිය සියයට 90 සිට සියයට 100ක් ලෙස දක්වා තිබුණ ද, සැලසුම් අංශය ඉදිරිපත් කලප්‍රගති වාර්තා අනුව එකී ප්‍රගතිය සියයට 7 සිට සියයට 50 දක්වා තරම් අවම මට්ටමක් දැන්වුණි.

(ඊ) 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ අනුකූලතා වාර්තාව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල නිකුත් කළ විගණන විමසුම් හා විගණන වාර්තා හා සැසඳීමේ දී, විගණන විමසුම්, අභ්‍යන්තර විගණනය, වත්කම් මිලදී ගැනීම් හා විනාශ කිරීම, භාණ්ඩ සමීක්ෂණය, වාහන ලොග් පොත් පවත්වාගෙන යාම, බැංකු ගිණුම් කළමනාකරණය, රාජ්‍ය නිලධාරීන් සඳහා අත්තිකාරම් ගිණුම් සහ මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම යනාදිය සම්බන්ධයෙන් වූ අනුකූලතා නොවීම් 09 ක් නිරීක්ෂණය විය.

3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක ව්‍යාපෘති 02කට අදාළව විධිමත් තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කර නියමිත සම්පිණ්ඩන ශක්තිය පවතී දැයි නහවුරු කර ගැනීමකින් තොරව කොන්ක්‍රීට් මිශ්‍රණ අතුරා ඉදිකරන ලද මාර්ග 04 කට අදාළව කොන්ක්‍රීට් ඝන මීටර් 64.09(m^3) ක් සඳහා රු. 1,876,515ක් ගෙවීම් නිර්දේශ කර ගෙවාතිබුණි.

(ආ) කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේ දී ව්‍යාපෘති 12ක් වැඩ විෂයයන් 14ක් සඳහා රු. 221,093ක් විශේෂ ගාස්තු උප ලේඛන/ගාස්තු විශ්ලේෂණ (SSR/Rate Analysis) යටතේ ගෙවා තිබූ නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයාගේ හෝ ඉහළ තාක්ෂණික දැනුම් ඇති නිලධාරියෙකු ලවා පරීක්ෂා කරවා ගෙන නිර්දේශ කර අනුමත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මහාමාර්ග පිළිබඳව ඝාස්තු උපලේඛනය (HSR) ST 47 අනුව 1:2:4 කොන්ක්‍රීට් මිශ්‍රණයේ අවම සම්පිණ්ඩන ශක්තිය 20 N/mm² විය යුතු අතර මෙම සම්පිණ්ඩන ශක්තිය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ලෙස හැමර් පරීක්ෂාව සිදුකර ප්‍රතිපාදන මුදල් එකතුව රු. 2,500,000ක් වූ මාර්ග 04ක් අසමත් ලෙස හඳුනාගෙන තිබුණි. මෙලෙස අසමත් වූ මාර්ග සඳහා කෝ කටර් (Core Cutter) පරීක්ෂාවක් සිදුකර තිබුණු අතර එම පරීක්ෂාව ද අසමත් වී තිබුණි. මෙම මාර්ගයන් සම්බන්ධයෙන් ද්‍රව්‍ය මැනීම සඳහා සම්මත ප්‍රමාණයේ පෙට්ටි භාවිතා නොකිරීමත්, ක්ෂේත්‍රයට ගෙනෙන ලද වැලි නියමිත ප්‍රමිතියෙන් නොමැති වීමත්, භාවිතා කළ ද්‍රව්‍යයන් ඒවායේ මූලාශ්‍ර සහිතව සටහන් කර ගැනීමට සංවර්ධන නිලධාරී / කාර්මික නිලධාරී කටයුතු කර නොතිබීමත්, පරීක්ෂණ වාර්තාව අනුව පර්යේෂණ නියැදිවල සනකම නියමිත සනකම වූ 0.15mට වඩා අඩු අගයන් පැවතීමත් ඒ අනුව මාර්ගයේ පිරිවිතර කෙරෙහි සමීප අධීක්ෂණයක් සිදුකර නොමැති බවත් නිරීක්ෂණය කෙරේ.

(ඈ) කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරපිංව රබර් පැල තවානේ භූමිය සකස් කිරීම හා ග්ලයිෆොසෙට් ගබඩා කිරීමට සුදුසු පරිදි ගොඩනැගිල්ලක් සකස් කිරීම සඳහා කැනීම් යන්ත්‍රයක් (excavator) මගින් ගස් ඉවත් කර භූමිය සකස් කිරීම වෙනුවෙන් 2020 සැප්තැම්බර් 29 දින කොන්ත්‍රාත්කරුට රු. 959,020ක් ගෙවා තිබුණි. 2021 නොවැම්බර් 29 දින සිදුකළ විගණන පරීක්ෂාවේ දී යන්ත්‍රය භාවිතා නොකල යන්ත්‍ර මීටර් පැය 455.47ක් සඳහා රු. 783,408ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණ විය. එසේම මෙම කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 06 යටතේ දෝෂයක් ද පැවති අතර සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් ගෙවීම් නිර්දේශ නොකර ඒ වෙනුවට පරිපාලන නිලධාරී විසින් ගෙවීම් නිර්දේශ කර තිබුණි. තවද, සැපයුම්කරුගෙන් ගෙවීම් සඳහා බිල්පතක් ද ලබාගෙන නොතිබුණි.

(ඉ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය විෂයය අංක 121-2-4-3-2509 යටතේ රු. 2,000,000ක් බැගින් දින 68 තුල ඉදිකිරීමේ පදනම මත 2017 ඔක්තෝබර් 25 දින ගිවිසුම්ගත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ගල්ලින්න නිල සෙවන කාර්යාලය හා මොරනොට නිල සේවන කාර්යාලය ඉදිකිරීම සම්බන්ධයෙන් වැඩ විෂයයන් 16 කට අදාලව රු. 567,269ක් වූ වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2022 පෙබරවාරි 02 වන විටත් පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 156(1) කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

(ඊ) දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩසටහන - 2015 යටතේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මැදබැද්ද සේවා පියස කාර්යාලය ඉදිකරන ලද භූමියේ/ ප්‍රදේශයේ පයෙහි ස්වභාවය පිළිබඳ නිසි අවධානයකින්/ පරීක්ෂාවකින් පසුව ඊට ගැලපෙන පරිදි ගොඩනැගිල්ලේ අත්තිවාරම සඳහා සැලසුම්/ ඇස්තමේන්තු සැකසිය යුතු වුවද, ඒ පිළිබඳව නිසි සැළකිල්ලක් නොදක්වා (අනවධානයෙන්)ගොඩනැගිල්ලේ අත්තිවාරම කළුගල් හා

සිමෙන්ති පමණක් යොදා ගනිමින් ඉදි කිරීම හේතුවෙන් අසාමාන්‍ය ඉරි තැලීමකට ලක් වූ රු. 1,279,531ක් වූ ගොඩනැගිල්ල ඉදිකිරීම් නිමකර වසර 05කට පසු කඩා ඉවත් කිරීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිර්දේශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මූදල් රෙගුලාසි 156 (1) කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කෙරේ.

(ඇ) ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී රු. 4,455,579ක වියදමින් 2020 වර්ෂයේ දී තාර/කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කරන ලද මාර්ග ව්‍යාපෘති 03ක් හාවිතා කළ හැකිව තිබිය දී නැවත කාපට් කිරීම සඳහා මාර්ගය සැකසීම නිරීක්ෂණය විය. මෙසේ එකම මාර්ගය ඉදිකිරීම සඳහා අවස්ථා දෙකක දී වියදම් දැරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 පෙබ්රවාරි 12 දිනැති අංක 2/2021 දරන "දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පිළිබඳ මාර්ගෝපදේශය" නම් වක්‍රලේඛයේ පළමු ඡේදය කෙරෙහි අවධානය යොමුකර පොදු එකඟතාවය මත සංවර්ධන කටයුතු සිදු නොවීම බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ඈ) අමාත්‍යාංශය 02ක් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් වෙත විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනයන්ට අනුකූලව කර්මාන්ත 06 ක වැඩ විෂයයන් 11 ක් ඉටුකිරීම සඳහා එකතුව රු. 2,583,904 ක් වූ ගිවිසුම්වලට එළඹ තිබුණි. එකී වැඩ විෂයයන්වලට අදාළ මිනුම් කිරීමේ දී රු. 211,098 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) 2017 වර්ෂයේ මැයි මාසයේ ඇති වූ හදිසි ගංවතුර හා නායයාම් හේතුවෙන් විපතට පත් පවුල් පදිංචි කිරීම සඳහා වෙන්කර ඇති ඉඩමේ මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් කිරීම සඳහා 2020 වර්ෂයේ දී කිරිඇල්ල හා ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා පිළිවෙලින් රු. මිලියන 08 ක් සහ රු. මිලියන 10ක මූදලක් රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් වෙන්කර තිබුණි. උක්ත මාර්ග කොන්ක්‍රීට් කිරීමේ කටයුතු වෙනුවෙන් 2020 වර්ෂය සඳහා වෙන්කර තිබූරු. මිලියන 18 ක මූදල සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9 ඡේදයේ 3.9.2 යටතේ ප්‍රජාපාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් ලබාදීම සහ 3.9.4 යටතේ ලංසු කැඳවා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීම යන විකල්ප ක්‍රම දෙක පිළිබඳවම මාර්ගෝපදේශ ලබා දී තිබුණ ද, 3.9.4 කෙරෙහි විශේෂ අවධානය යොමුකර තූරහකාරී ප්‍රසම්පාදනයෙන් රජයට ලබාගත හැකි වාසි පිළිබඳ අවධානය යොමු නොකර අදාල කටයුතු ප්‍රජාපාදක සංවිධාන වෙතින් කර්මාන්තය කොටස් කර ඉටුකරවා ගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඒ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශ වැය ශීර්ෂ 409-02-09-02-2509 යටතේ රු. 9,570,986ක ප්‍රතිපාදන ආපදා අවම කිරීම සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ අතර, මේ යටතේ රු. 6,293,683ක වියදමක් දරා ඇඹිලිපිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ වැව් 03 ක් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර තිබුණි. මෙම වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත්තු ලබාදීමේ දී ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර නොතිබූ බවත්, මෙම වැව් අළුත්වැඩියාවෙන් පසුව අපේක්ෂිත පරිදි වගාබිම ප්‍රමාණයෙහි කිසිදු වැඩි වීමක් සිදු වී නොමැති බවත්, මෙම වැව් පිළිබඳව 2022 පෙබරවාරි 09 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී වැව්වල ජල මට්ටම් ඉතා අවම මට්ටමක පැවතීමත් හේතුවෙන් මෙම වැව් ප්‍රතිසංස්කරණ කටයුතු තුළින් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොමැති බවත් නිරීක්ෂණය විය. තවද, මූලිකව වැව් අළුත්වැඩියාව සඳහා රු. 15,700,000ක ප්‍රතිපාදනයක් ලැබී තිබූ අතර මූලිකව මූදාහල ප්‍රතිපාදනයට වඩා බොහෝ සේ අඩු ඇස්තමේන්තු ගකස් කර ඇති බවත්, එම ඇස්තමේන්තුව අනුව ද ඉටුකළ යුතු කොටස් සිදුකර නොමැති බවත්, මෙලෙස අතහැර දමන ලද සමහර කාර්යයන් අත්‍යාවශ්‍ය කාර්යයන් බවත් නිරීක්ෂණය විය. මෙලෙස එක් එක් වැවෙහි රු. 1,119,577ක් වටිනා වැඩ විෂයයන් 23ක් අතහැර දමා තිබුණි.

(ඕ) ඇහැලියගොඩ නැදුරත මොරපිටියවත්ත පාලම නැවත ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු වටිනාකම රු. 4,673,034 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දින වැඩ අවසන් කර භාරදිය යුතු විය. අවස්ථා 02 ක දී දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණ ද, 2022 අප්‍රේල් 01 දින භෞතිකව පරීක්ෂා කළ අතර එදින වන විට ද භෞතික ප්‍රගතිය සියයට 30ක් තරම් පහළ මට්ටමක පැවතුණි. පාලමේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදය හේතුවෙන් ගම්වාසීන්ට පුවක් හා ලී කොටන් යොදා සාදන ලද අනාරක්ෂිත තාවකාලික පාලමෙන් තම අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී තිබුණු බව ද තවදුරටත් නිරීක්ෂණය විය.

3.4 වත්කම් කළමනාකරණය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15ක වර්ෂයක සිට වර්ෂ 40 ක පමණ කාලයක් නිස්සේ භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 122ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ෂයකට අධික කාලයක් නිස්සේ භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 06ක් ඵලදායී කාර්යයකට යොදවා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර විගණිත දිනය වූ 2022 මාර්තු මස 30 දින වන විටත් ගොඩනැගිලි අබලන්ව පැවතීම, වල්බිහි වී විනාශ වී පැවතීම ආදී කරුණු නිරීක්ෂණය විය.

3.5 රජයේ නිලධාරීන් ඇප කැබීම

මූදල් රෙගුලාසි 880 හා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 07/2019 දරන හා 2019 මාර්තු 23 දිනැති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක ඇප කැබිය යුතු නිලධාරීන් 29 දෙනෙක් විසින් අදාළ ඇප මුදල් තැන්පත් කර නොමැති බවත්, මූදල් රෙගුලාසි 881 (ii) සඳහන් විධිවිධාන ප්‍රකාරව එලෙස ඇප කැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන්ගෙන් නියමිත කාල සීමාව තුළදී ඇප ලබා ගැනීමට කටයුතු කර නොමැති බවත්, නිරීක්ෂණය විය.

3.6 අනාර්ථික ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් ආරම්භ කර තිබුණු නමුත් ස්ලැබ් එක (Slab) පමණක් ඉදිකිරීමෙන් පසුව ඉදිකිරීම් නැවතා දමා තිබුණි. විස්තර පහත දැක්වේ.

ඇස්තමේන්තු පිරිවැය	2010, 2011 සහ 2012 වර්ෂවල ලැබුණු ප්‍රතිපාදන මත ඉදිකිරීම් පිරිවැය
(රු.)	(රු.)
19,087,728	3,535,723

වසර 08 කට පසුව එනම් 2021 වර්ෂයේ දී ඉතිරි වැඩ නිම කිරීම සඳහා ලැබුණු රු. 26,419,500 ප්‍රතිපාදනය පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිසා 2021 ඔක්තෝම්බර් 08 දින ආපසු පවරා දී තිබුණි.

එනම් ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොවීම, පසුවිපරම් ක්‍රියාවලිය දුර්වල වීම හා නිසි අධීක්ෂණයක් නොවීම .

2021 නොවැම්බර් 29 දින සිදුකළ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේ දී නවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

එනම්, ඉදිකිරීම් සිදුකර ඇති ස්ථානය සම්පූර්ණයෙන්ම වල් බිහි වී තිබීම, ඉදිකිරීම් පරිශ්‍රය තුළ විශාල ගස් වර්ධනය වී තිබීම.

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේ දී ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 11 ක් ගත වී ඇති රු. 3,535,723ක පිරිවැය වූ මෙම ඉදිකිරීම නිෂ්කාර්යය වලරහිත අනාර්ථික ගනුදෙනුවක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රිදිගල ග්‍රාම නිලධාරී වසමේ තලාව හේන මැදි කිරිදිගල මාර්ග කොටස ඉදි කිරීමේදී හා පස් පිරවීමේ දී බලංගොඩ නගර සභාව සමඟ විධිමත් එකඟතාවයකින් යහ නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව දිග මීටර් 51.77 ක් වන ලෙස 2017 දෙසැම්බර් 15 දින වැඩ අවසන් කර තිබුණු අතර, මෙම මාර්ගයේ රු. 105,324 ක් වැය කර ඉදි කරන ලද පළමු මීටර් 16.14 කොටස මත මීටර් 1.2ක් වන සේ පස් යොදා අනවසරයෙන් ගොඩ කිරීම හේතුවෙන් දරන ලද ව්‍යදම 'නිෂ්කාර්යය ව්‍යදමක් බව නිරීක්ෂණය වූ අතර රජයට සිදු වූ පාඩුව පූර්ණය කරවා ගැනීම කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කෙරේ.

(ඇ) ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද රු. 1,500,000ක ප්‍රතිපාදනය මත කුරුවිට ප්‍රාදේශීය සභාව සමඟ 2021 මාර්තු 23 දින ඇති කරගත් අවබෝධතා ගිවිසුම යටතේ කොස්ගල වොලිබෝල් ක්‍රීඩාංගනය සංවර්ධනය කර 2021 අගෝස්තු 05 වන දින වැඩ අවසන් කර තිබුණු නමුත් විගණන දිනය වූ 2022 පෙබරවාරි 25 දින දක්වාම ක්‍රීඩාපිටිය භාවිතා කර නොතිබූ අතර වල් බිහි වී විනාශයට පත් වෙමින් තිබුණි.

(ඈ) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ ශ්‍රායතික සේවා සැපයීම සඳහා රු. 495,000ක් වැය කර කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශට අයත් එපිටවල සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල අලුත්වැඩියාව 2020 මැයි 01 දින වැඩ අවයන් කර තිබුණු නමුත් විගණන දිනය වූ 2022 ජනවාරි 05 වන විටත් මෙම ගොඩනැගිල්ල භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණු අතර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය වෙනත් ස්ථානයක සායනික කටයුතු සිදුකර තිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 17 න් 12ක් ගංවතුර තර්ජනයට ලක්වන ග්‍රාම සේවා වසම් වන අතර, මෙම ගංවතුර අවධානමට පෙර සූදානමක් ලෙස ග්‍රාම නිලධාරී වසම් සඳහා ඔරු ලබා දී ඇති අතර, මෙලෙස ලබාදෙන ඔරු 51 ක් අතරින් 22ක්ම විවිධ හේතූන් මත භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් පවතින බව නිරීක්ෂණය විය. මෙම හේතුවෙන් හදිසි ආපදා තත්ත්වයක දී මෙමඟින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙනු ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 07 කට අදාළව ග්‍රාම නිලධාරී කාර්යාල පිහිටා ඇති රජයේ ඉඩම් කැබලි 45 ක් 2022 ජනවාරි 13 විගණන දින වන තෙක්ම හිමිකම් නිරවුල් කරගෙන ප්‍රාදේශීය ලේකම් භාරයට ගැනීමට අදාළ කටයුතු සිදුකර නොනිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක විශ්‍රාමිකයින් 44 දෙනෙකුට අදාලව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්වලින් විගණන දිනය වූ 2022 පෙබරවාරි 25දින වන විට නවදුරටත් අයකරගත යුතුව පැවති ශේෂය රු. 4,739,295 ක් විය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14කට අදාළව රාජ්‍ය ආයතන 183ක් සම්බන්ධයෙන් රජයේ ඉඩම් පවරා ගැනීමට ඉල්ලුම් කර විගණන දිනය වූ 2022 මාර්තු 25 වන විට වසර 01 සිට වසර 21 දක්වා කාලයක් ගතව ඇතත් එකී රාජ්‍ය ආයතන වෙත රජයේ ඉඩම් පවරා දීමට අවශ්‍ය කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) ග්‍රාමීය කාන්තාවන් ආදායම් උත්පාදන මාර්ගවලට යොමු කිරීම හා ආදායම් උත්පාදන මාර්ගවල යෙදී සිටින කාන්තාවන් නවදුරටත් දිරිමත් කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක වක්‍රීය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. මේ යටතේ ලබාගත් ණය මුදල සමාන වාරික 10කින් ගෙවා අවසන් කළ යුතුවුවත්. ණයලාභීන් 97 දෙනෙකු ලබාගත් ණය මුදලින් එකතුව රු. 485,590 ක මුදලක් මාස 05 සිට මාස 141 දක්වා අතර කාලයක සිට නිහව පැවතුණි.

3.8 නොවිසඳුණු විගණන ඡේද

ඉකුත් වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් නවදුරටත් නිවැරදි කර නොතිබුණු ඡේදයට යොමුව පහත දැක්වේ.

විගණකාධිපති වාර්තාවට යොමුව		යොමුගත විෂයය
වර්ෂය	ඡේද අංකය	
2015	3.12 (ඇ) (IV)	2010 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ නමුත් 2015 දෙසැම්බර් මාසය විටත් අරමුණුගත කාර්යයෙහි යෙදවීමට අපොහොසත් වීම නිසා සංස්කෘතික මධ්‍යස්ථාන 04ක් ඉදිනිරීම්වෙනුවෙන් එම කාල පරිච්ඡේදය තුළ වැය කළ රු. 6,693,388ක් නිශ්ඵල වී තිබුණි. නවද. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එකී ඉදිකිරීම් කටයුතු අවසන් කරඅරමුණුගත කාර්යයෙහියෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන් නොතිබුණි.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු

අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමක් හා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීමක් සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයන්හි විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති නමුත් ඒ පිළිබඳව විගණිත දිනය වූ 2022 මාර්තු 25 වන විටත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008හි 1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියේ සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම සහ ඇගයීම හා වැඩිදියුණු කිරීම සිදු කල යුතු වූවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල03ක 2014 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18ට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තත්‍ය සේවක සංඛ්‍යාව සමග සැසඳීමේ දී පුරප්පාඩු සේවක සංඛ්‍යාව 172 හා අතිරික්ත සේවක සංඛ්‍යාව 117ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට අනුව මානව සම්පත් හිඟය සහ අතිරික්තය ආයතනයේ කාර්යසාධනයට බලපාන ආකාරය පිළිබඳව පොදු අදහසක් ඉදිරිපත් කර තිබුණු අතර සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 08ක, සහකාර අධ්‍යක්ෂක ක්‍රම සම්පාදන තනතුරු 08ක, කාර්මික නිලධාරී තනතුරු 19ක සහ ග්‍රාම නිලධාරී තනතුරු 85ක පුරප්පාඩුව පැවතීම ප්‍රාදේශීය පරිපාලනයට සහ සංවර්ධන කටයුතුවලට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය කෙරේ.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට ද්විතියික මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 117ක අතිරික්තයක් පැවති නමුත් මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව එම තනතුරු අනුමත කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.